# අපූරු යාළුකම



ඩබ්.එස්. යුමන්ගි මියනපලාව

# අපූරු යාළුකම

ඩබ්.එස්. යුමන්ගි මියනපලාව
කතෘ

## පළමු දිගහැරීම

මහ/ මහාමායා බාලිකා විද්‍යාලය
2 ශ්‍රේණිය C

2026-05-10
ISBN : 978-624-211-234-3

# පිදුම

නිරතුරුව

මා හට

මග පෙන්වන

මගේ පවුලේ

සියළු දෙනාටත්

පන්ති භාර

තමිලා කරුණාරත්න

ගුරුතුමියටත්

ආදරයෙන්

තිළිණ කරමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකි ය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලැබෙන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සැලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලි ය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමින් මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලැබෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත<br>
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය<br>
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූදරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස් අනිවාර්ය ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබාදීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටියි. එවැනි පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරන වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව.<br>
2026-05-10

ඔන්න එකමත් එක ගමක දුප්පත් ගෙදරක පූසෙක් හිටියා. දවසක් මේ ගෙදර අය කොහෙදෝ ගමනක් ගිහින්, පූසාට හරිම බඩගිනියි. පූසා 'ඤාව් ඤාව්' ගෑවා.



ඊට පස්සේ පූසා ගසක් යට හැංගිලා බලාගෙන හිටියා.
එතකොට එයා දැක්කා ලොකු කොලයක් යට
හැංගිලා හිටපු මීයෙක්. පූසා 'ඥාව්' කියලා
පනිනකොටම බයවෙලා බලන් හිටිය මීයා දුවන්න
පටන් ගත්තා.

"මම ඊළඟ දවසේ අල්ලා ගන්නම්"
කියලා පූසා හිතුවා.



ඊළඟ දවසෙත් පූසා ගස යට හැංගිලා බලාගෙන ඉන්නකොට මීයාව දැක්කා. පූසා මීයාව අල්ලාගෙන ගිලින්න හැදුවා.



“අනේ පූස් යාළුවේ, මාව ගිලින්න එපා”
මීයා අඬ අඬා කිව්වා.
“අපි දෙන්නා යාළුවෝ වෙමුකෝ, ඔයාටත් සෙල්ලම් කරන්න කවුරුවත් නෑ. මටත් සෙල්ලම් කරන්න කවුරුවත් නෑ” මීයා කීවා. පූසා ඒ අදහසට කැමැති වුණා.



දැන් දෙන්නා හොඳ යාළුවෝ. “එන්න සෙල්ලම් කරන්න” කියලා කිව්වා. “ ආ. මෙන්න යාළුවේ” කියලා කෑමකුත් හොයාගෙන ඇවිත් මීයාටත් දුන්නා. දෙන්නම ඒක කාලා ආයෙත් සෙල්ලම් කරන්න පටන් ගත්තා.



මේ දෙන්නා කෑමක් සොයාගන්න ගියා. එතකොට දැක්කා ලොකු ගෙයක්. ගෙදර කවුරුවත් නෑ. මේ දෙන්නා කෑම මේසෙටම නැගලා තියෙන කෑම ටික කන්න පටන් ගත්තා.



එකපාරටම සද්දයක් ඇහුණා. ගෙදර අය ඇවිත්.
"දැන් මොකද කරන්නේ" යාළුවෝ දෙන්නා
හොඳටම බය වුණා.




“දුවමු දුවමු යාළුවේ. පණ බේරාගෙන දුවමු” මීයා කිව්වා. දැන් ගෙදර නැන්දා මේ දෙන්නව පන්නනවා.



**පූසයි මීයයි දුවලා දුවලා ගිහින් ලොකු භාජනයක් ඇතුළට රිංගා ගත්තා. “දැන්නම් කාටවත් අපිව හොයාගන්න බෑ” පූසා කිව්වා.**



ටිකක් වෙලා භාජනය ඇතුලේ හැංගිලා හිටියා.
නැන්දා එයාලව හොයාගන්න බැරුව ආපහු ගියා.
"යාළුවේ, අපි බේරුණා, නැන්දා ගියා, දැන් එළියට යමු" මීයා කිව්වා.



ඊට පස්සේ දෙන්නාම එළියට ගිහින් ආපහු සෙල්ලම් කරන්න ගියා. "කෝ, බෝලය මට එවන්න" පූසා කිව්වා. මේ දෙන්නා සතුටින් සෙල්ලම් කළා. තව හාවෝ, ගිරව් එහෙමත් සෙල්ලම් කරන්න ආවා. හැමෝටම ගොඩාක් සතුටුයි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසා දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සම්මතයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ ආකෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මඟේ හැරවුම් ලක්ෂ්‍යයක ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත පත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයක් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සල්බල ගැන්වීමට ඉතිහාසය යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

**සෙනෙවිරත්න මහලේකම්**
**(ව්‍යාපෘති නිර්මාතෘ)**
**ISBN : 978-624-211-234-3**